Department of Education, Sabaragamuwa Province/ Weekly School Department of Education, Sabaragamuwa Province/ Weekly School



නිපුණතාව 08 - සාර්ව ආර්ථික අරමුණු ළඟා කර ගැනීමෙහි ලා රජය මැදිහත් වන ආකාරය විමර්ශනය කරයි.

නිපුණතා මට්ටම 8.2 - වෙළෙඳපොළ අසාර්ථක වීම කෙරෙහි බාහිරතාවල බලපෑම පරීක්ෂා කරයි.

**බාහිරතා -**

- කිසියම් නිෂ්පාදන හෝ පරිභෝජන හෝ ක්‍රියාවක් නිසා වෙනත් පාර්ශවයක් මත ඇති කරන,නිෂ්පාදන හෝ පරිභෝජන හෝ ක්‍රියාවට සෘජුවම සම්බන්ධ අය විසින් සැලකිල්ලට නොගන්නා ප්‍රතිලාභ හෝ පිරිවැයයි.
- බාහිර පිරිවැය - වෙනත් පාර්ශවයක් වෙත ඇති කරන අහිතකර ප්‍රතිවිපාක
- බාහිර ප්‍රතිලාභ - වෙනත් පාර්ශවයක් වෙත ඇති කරන හිතකර ප්‍රතිවිපාක
- හිතකර ප්‍රතිවිපාක ධන බාහිරතා ලෙසත්,අහිතකර ප්‍රතිවිපාක සෘණ බාහිරතා ලෙසත් හැඳින්වේ.
- බාහිරතා අසල්වැසි ප්‍රතිවිපාක හෝ තෙවැනි පාර්ශ්ව ප්‍රතිවිපාක ලෙසද හඳුන්වයි.
- බාහිරතා උපදවන මූලාශ්‍ර දෙකකි.
  1.නිශ්පාදනය
  2.පාරිභෝජනය

  මෙම මූලාශ්‍රය මත හට ගන්නා බාහිරතා ප්‍රභේද 4කි.

  1.නිෂ්පාදනයේ සෘණ බාහිරතා
  2.නිෂ්පාදනයේ ධන බාහිරතා
  3.පාරිභෝජනයේ සෘණ බාහිරතා
  4.පාරිභෝජනයේ ධන බාහිරතා

**අභ්‍යාස**

1.ඉහත සඳහන් ප්‍රභේද 4 උදාහරණ සමඟ පැහැදිලි කරන්න.
2. සමාජ පිරිවැය හා සමාජ ප්‍රතිලාභ යන පද පැහැදිලි කරන්න.
3.නිෂ්පාදනයේ සෘණ බාහිරතාවකදී වෙළෙඳපොල අසමත්වීම සිදුවන ආකාරය රූප සටහනකින් දක්වන්න.
4. නිෂ්පාදනයේ ධන බාහිරතාවකදී වෙළෙඳපොල අසමත්වීම සිදුවන ආකාරය රූප සටහනකින් දක්වන්න.